සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

9 ශ්‍රේණිය

ප්‍රායෝගික තාක්ෂණික කුසලතා

නම/විභාග අංකය :-- .... කාලය: පැය 02 යි.

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **වඩාත්ම නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

I කොටස

(1) සාමාන්‍යයෙන් උස් පාත්තියක රාමුවක් සකසා ගැනීමේදී දිග පළල සහ උස විය යුත්තේ,

1. 120 - 180 cm 90 - 100 cm 20 - 30 cm වේ.
2. 100 - 150 cm 50 - 60 cm 120 - 180 cm වේ.
3. 100 - 160 cm 10 - 20 cm 20 - 30 cm වේ.
4. 10 - 20 cm 100 - 110 cm 30 - 40 cm වේ.

(2) බඳුන්ගත වගාව සඳහා සිමෙන්ති පෝච්චියක් භාවිතයේ දී යොදා ගත යුතු මාධ්‍යය පිරවීමේ දී සුදුසු ද්‍රව්‍ය ක්‍රමය වන්නේ,

1. මාධ්‍යය, ගඩොල් කැබලි, කොළ රොඩු, වක්‍රවූ උළුකැට කැබලි
2. වක්‍ර උළුකැට කැබලි, ගඩොල් කැබලි, මාධ්‍යය, වියලි කොළ රොඩු
3. ගඩොල් කැබලි, උළු කැට කැබලි, කොළරොඩු, මාධ්‍යය
4. කොළ රොඩු, උළුකැට කැබලි, ගඩොල් කැබලි, මාධ්‍යය

(3) පතෝල කරවිල වැනි වගාවකදී පොල් අතු වලින් ආවරණය කරන්නේ,

1. අනෙක් අයට පේනවට
2. සතුන්ගෙන් ආරක්ෂා කර ගැනීමට
3 පළතුරු මැස්සාගෙන් ආරක්ෂා වීමට
4. මායිම දැක්වීමට

(4) සැකසූ ආහාර වලින් සැළසෙන වාසියක් නොවන්නේ,

1. පිළියෙල කිරීම පහසුවීම
2. රැගෙන යාම පහසුවීම
3. ගබඩා කිරීම පහසු වීම
4. ආහාර වල විවිධත්වයක් ඇතිවීම

(5) තම්බන ලද සහල් වල සහල් ඇටයට උරාගනු ලබන්නේ කුමන විටමිනය ද?

1. විටමින් A
2. විටමින් B
3. විටමින් C
4. විටමින් D

(6) පාංශු ඛාදනය වලක්වා ගත හැකි ක්‍රමයක් නොවන්නේ,

1. ජීව සහ අජීව වැටි සෑදීම
2. සමෝච්ච රේඛා ක්‍රමයට කානු කැපීම
3. පස ආවරණ බෝග සිටුවීම
4. බෑවුම දිශාවට කාණු කැපීම

(7) ශ්‍රී ලංකාවේ වගුරු බිම් වර්ග තුනක් හඳුනාගත හැකි ය. ඉන් කිවුල් දිය වගුරු බිමට උදාහරණයකි.

1. බෙල්ලන්විල වගුරු බිම
2. මුතුරාජවෙල වගුරු බිම
3. මුන්දලම වගුරු බිම
4. මන්නාරම් වගුරු බිම

(8) ගොවිපල සතුන් ප්‍රධාන ක්‍රම,

1. එකකි
2. දෙකකි
3. තුනකි
4. හතරකි

(9) ජීව වායුව වශයෙන් හඳුන්වනු ලබන්නේ,

1. ඔක්සිජන්
2. කාබන්ඩයොක්සයිඩ්
3. මීතේන්
4. හයිඩ්‍රජන්

(10) ආහාර කල් තබා ගැනීමේ ක්‍රමයකි ශීතනය කිරීම එහිදී ඇති උෂ්ණත්වය,

1. $4C^0$ සිට $8C^0$ පරාසයකි
2. $8C^0$ සිට $20C^0$ පරාසයකි
3. $15C^0$ සිට $20C^0$ පරාසයකි.
4. - $8C^0$ සිට-$18C^0$ පරාසයකි

(11) හිතකර ක්ෂුද්‍ර ජීවීන් ආහාර මත ක්‍රියාත්මක වීමට සලස්වා අහිතකර ක්ෂුද්‍ර ජීවීන් මර්ධනය කර සකස් කළ ආහාරයකි.

1. මී කිරි
2. අයිස්ක්‍රීම්
3. සැලඩ්
4. පළතුරු බීම

(12) ට්‍රාන්සිස්ටරයක අග්‍ර හඳුන්වන නමක් නොවන්නේ,

1. පාදම
2. සංග්‍රාහකය
3. විමෝචකය
4. උදාසීන අග්‍රය

(13) PNP ට්‍රාන්සිස්ටරයක රූප සටහනක් පහත දක්වා ඇත. එහි 1 න් දක්වා ඇත්තේ



1. B
2. E
3. C
4. D

(14) ධාරිත්‍රයක සංකේතය දක්වා ඇත්තේ,


1.

2.


3.

4.

(15) ගෘහ විදුලි පරිපත සඳහා යොදා ගන්නා දුඹුරු වයරය හඳුන්වන්නේ,

1. සජීවී අග්‍රය
2. අජීවී අග්‍රය
3. උදාසීන අග්‍රය
4. භූගත අග්‍රය

(16) විදුලි සැර වැදුනු පුද්ගලයෙකු බේරා ගැනීමේදී පළමුවෙන්ම කළ යුත්තේ,

1. ප්‍රධාන වහරුව විසන්ධි කිරීමයි.
2. වියලි ලීයකින් තල්ලු කිරීමයි
3. වම් අතින් ඇදීමයි
4. දකුණු අතින් ඇදීමයි.

(17) ට්වීසරය මගින් කරන කාර්යය කුමක් ද?

1. කුඩා දෙයක් අල්ලා ගැනීම
2. ලොකු දෙයක් අල්ලා ගැනීම
3. විදුලි වැඩ කිරීම
4. වයර් පෑස්සීම

(18) වයර් දෙකක් පෑස්සීමේදී අප කළ යුත්තේ පළමුවෙන්ම

1. වයර් කොන් පිරිසිදු කිරීම
2. ඊයම් රත් කිරීම
3. බවුතය රත් කිරීම
4. ස්‍යාන්ද භාවිතය

(19) එළවලු නෙලා ගැනීම සඳහා විශේෂයෙන් දිනයේ වේලාවක් තීරණය කළ යුතු ය. කොළ එළවළු නෙලීමට සුදුසු වේලාව,

1. පෙරවරු 10.00 - ප. ව. 3.00 දක්වා
2. උදය වරුවේ
3. සවස් වරුවේ
4. හිරු බැසගිය පසු

(20) LDR එකක සංකේතය දක්වා ඇත්තේ



1. 2. 3. 4.

II කොටස

පළමුවන ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න 4 කට පිළිතුරු සපයන්න.

(1) මුළුතැන්ගෙයි අප ද්‍රව්‍ය තුළින් ජීව වායුව නිපදවාගන්නා ආකාරය රූප සටහන් සහිතව විස්තර කරන්න. (ල - 20)

(2) පසු අස්වනු හානිය යනු කුමක් ද? (ල - 10)

(3) පා පැදියක සේවා කිරීම විස්තර කරන්න (ල - 10)

(4) අලෙවිය සඳහා ප්‍රවර්ධනයට සුදුසු දැන්වීමක් පිළියෙළ කරන්න (ල - 10

(5) ජීවානුහරණය යනු කුමක්දැයි විස්තර කරන්න. (ල - 10)

Answer

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

9 ශ්‍රේණිය

ප්‍රායෝගික තාක්ෂණික කුසලතා - පිළිතුරු පත්‍රය

I කොටස

ප්‍රශ්න අංකය	පිළිතුරු අංකය	ප්‍රශ්න අංකය	පිළිතුරු අංකය	ප්‍රශ්න අංකය	පිළිතුරු අංකය	ප්‍රශ්න අංකය	පිළිතුරු අංකය
1	1	6	4	11	1	16	1
2	3	7	2	12	4	17	1
3	3	8	3	13	2	18	1
4	1	9	3	14	1	19	2
5	2	10	4	15	1	20	3

I කොටස ලකුණු 2 බැගින් ලකුණු 40

II කොටස 1 ප්‍රශ්නයට ලකුණු 20 ක් ද

අනෙකුත් ප්‍රශ්න වලට ලකුණු 10 ක් ද ලබා දෙන්න.